# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2320/67 – 2023 පෙබරවාරි මස 24 වැනි සිකුරාදා – 2023.02.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2003 අගෝස්තු මස 26 වැනි දින අංක 1303/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2003 අංක 123 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 03/J/89/PPI/208.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: DSM/DB/LND/4/1230 - III.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වගපනහ පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ, කොට්ඨාස අංක 2 පාදෙනිය (දඹුල්ල නගර සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මු. පි. මා. 1230 හා 2006.03.15 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් මායිම් තුළ වූ කොටස:

01. **කැබලි අංක 03 – ඉලුක්යාය හෙවත් පොල්වත්ත – ප්‍රමාණය: හෙක්. 1.0117**

උතුරට: මු. පි. මා. 931 හි කැබලි අංක 35; නැගෙනහිරට: තම්මැන්නා ඇළ; දකුණට: කැබලි අංක 4; බටහිරට: කැබලි අංක 4.

EOG 02 - 275